**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද ,යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සභා කාර්යය මණ්ඩලයේ වැටුප් ප්‍රතිපූර්ණය රු.7,830,959ක මුදල ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.4,914,396 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | භෞතිකව පවතින ලී බඩු හා කාර්යාල උපකරණවල වටිනාකම රු. 738,890 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් සභාව වෙත ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.65,167,117 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව සතුව භෞතිකව නොමැති ලී බඩු හා කාර්යාල උපකරණ රු.50,103 ක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.206,875 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | ලී බඩු හා කාර්යාල උපකරණ රු.143,184 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.56,634,678ක් වූ ගිණුම් විෂයයන් 16කට අදාල ශේෂයන් හා උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.15,884,803 ක වෙනසක් විය. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් වල පවතින වෙනස නිවැරදි කිරිමට කටයුතු කරන බව. | උපලේඛන හා මූ ල්‍ය ප්‍රකාශන අනුව ශේෂ අතර වෙනස්කම්වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.36,573,742ක් වූ ගිණුම් විෂයයන් 14ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | සෑම ගිණුම් විෂයක් සඳහාම තොරතුරු තහවුරු කරන ශේෂ ඉදිරි වර්ෂවල ගිණුම සමඟ ලබා දීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 104 | 2019 වර්ෂයේ සිට 2023 ජුනි 30 දක්වා කාලය තුළ ප්‍රාදේශීය සභාව පරිහරණය කරනු ලැබූ වාහන 07 ක අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ සිදු කර නොතිබුණි. | අදාල වාර්තා ඉදිරියේදී විගණනයට යොමු කරන බව. | රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | මු.රෙ.1646 | වාහන 02 ක 2020 හා 2021 වර්ෂයේ සිට ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සභාව සතු සියළුම වාහනවල ධාවන සටහන් නියමිත කාලයට විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛය | වාහන 05 ක අදාළ ආයතනයේ නම සමඟ රාජ්‍ය ලාංඡනය සලකුණු කර නොතිබුණි. | සලකුණු කිරීමට කටයුතු කරන බව. | යථෝක්ත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය | සභාවට අයත් වාහන 20 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාව කර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන බව. | යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,265,899 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.98,499,491 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගතආදායම් රැස්කළ ආදායම් හා ,බිල්කළ ආදායම් ,හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 13,071 | 13,571 | 9,479 | 16,111 | 12,676 | 103,131 | 8,276 | 2,036 |
| කුලී | 19,853 | 15,530 | 14,809 | 5,327 | 1,131 | 6,531 | 6,121 | 409 |
| බලපත්‍ර ගාස්තු | 2,201 | 1,452 | 383 | - | 500 | 358 | 358 | - |
| වෙනත් ආදායම් | 98,240 | 103,518 | 2,615 | - | 72,379 | - | 108,536 | - |
| | 133,365 | 134,071 | 27,286 | 21,438 | 86,686 | 110,020 | 123,291 | 2,445 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු. මිලියන 134.07 ක් වූ අතර ඉන් රු.මිලියන 27.28 ක් රැස්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. *මිලියන* 21.44 ක් තව දුරටත් අයකර ගැනීමට පැවතුණි. | නිරීක්ෂණය සඳහා අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | නොපමාව බිල්කළ හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබූ හිඟ වරිපනම් ශේෂය රු.11,616,234ක් විය. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය රු.116,271 ක් විය. | අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | නොපමාව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 9,584 ක් සඳහා මුළු වරිපනම් හිගය රු.15,975,313ක් වූ අතර, ඒ තුළ රු.25,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 18 ක් සඳහා වූ හිඟය රු.663,514 ක් වී තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | නොපමාව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 27 කින් ලැබිය යුතු හිඟ කඩකාමර කුලිය රු.1,537,325 ක් වූ අතර එම හිඟ ශේෂ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟයෙන් රු.688,942 ක් මේ වන විට අය කර ගෙන ඇති බව. | සම්පූර්ණ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභා රීති 61 ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබාගන්නා ලැයිස්තුවේ ඇතුළත් කර්මාන්ත සියල්ල, කර්මාන්ත පිළිබඳ බදු ලේඛනයේ හා ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත් ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. | සමීක්ෂණය සිදුකර ලබාගන්නා ලැයිස්තුවේ ඇතුලත් කර්මාන්ත සියල්ල කර්මාන්ත පිළිබඳ බදු ලේඛනයේ හා ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික සමීක්ෂණය අනුව කර්මාන්ත ලේඛනගත කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර ටොන් 15.4 ක් නිෂ්පාදනය කර තිබූ අතර පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ටොන් 4.96 කින් හෙවත් සියයට 32 කින් අඩු වී තිබුණි. | කොම්පෝස්ට් සෑදීමට යොදාගන්නා හලර් යන්ත්‍රය මාස 06කට අධික කාලයක් අක්‍රීය වී පැවතීම නිසා එම වසරේ කොම්පෝස්ට් නිෂ්පාදනය අඩාල වී පැවතුන බව. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩිකර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි සංවිධානයකට 2021 වර්ෂය සඳහා සභාවෙන් ණය පදනම මත ලබාදුන් කැටගල් 8,350 ට අදාළ වටිනාකම රු.306,250 ක් අයකරගෙන නොතිබුණි. | නඩු පැවරීම සඳහා අදාල ලිපි ලේඛන ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. ආයතන සංග්‍රහයේ කොන්දේසි ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට නීති සහාය ලබා දීමට නීතිපති දෙපාර්තමේන්තුවට නොහැකි බව. | සභාවට සිදුවූ අලාභය සලකා ඉදිරියේදී අධිහාර පැනවීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ටෙන්ඩර් කර බදු දීම සඳහා දැන්වීම් පළ කළ වත්කම් 51 න් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වත්කම් 32 ක් සඳහා සභාව තීරණය කරන ලද අවම ලංසුවවත් ආවරණය කර ගන්නා පරිදි බදු දීමට නොහැකි වීම මත සභාවට ලැබිය හැකි ආදායම් අහිමි වී තිබුණි. | සිව්වරක් ටෙන්ඩර් කළ ද වත්කම් 32 ක් සඳහා කිසිඳු ගැනුම්කරුවෙකු ඉදිරිපත් නොවුණු බවත්. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුට්ටිගල් ව්‍යාපෘතිය සඳහා ලබාගෙන තිබූ රු. 1,397,152 ක් වටිනා කුට්ටිගල් කපන මැෂින් 04 ක් ප්‍රයෝජනයට නොගෙන සභා පරිශ්‍රයේ අනාරක්ෂිතව තබා තිබුණි. | කුට්ටිගල් ව්‍යාපෘතිය මේ වන විට තාවකාලිකව නවතා ඇති අතර මෝටර් 4 ගලවා ගබඩාවට භාර දී ඇත. මැෂින් 4 එම පරිශ්‍රයේ ආරක්ෂිතව ඇති බව. | සභාව සතු වත්කම් වලින් ආදායම් උපයා ගැනීමට හා එම වත්කම් වල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව (කර්මාන්ත අංශයේ ආංශික සැලැස්ම) සභාව විසින් ව්‍යාපෘති 41 ක් ඉටුකළ යුතු වුවත් ඉන් ව්‍යාපෘති 04 ක් පමණක් ඉටුකර තිබුණි. සංශෝධිත ව්‍යාපෘති හා ඒ සඳහා වාර්ෂික අයවැය මඟින් රු.18,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති යෝජනාවලින් හදිසි ආපදා මත මහජන ඉල්ලීම් යෝජනා වලට ප්‍රමුඛතාවය දී ගරු ආණ්ඩුකාරතුමා හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත එම යෝජනා සිදු කරන ලද බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියා කළ යුතුය. |